**ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 22 විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 26දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ බැංකු පොළී රු.309,394 ක් ආදායම් ණය ගැතියන්ට ගලපා තිබුණද මුදල් පොතට ගැලපීම් නොකිරීමෙන් බැංකු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | සංශෝධිත මුදල් පොතෙහි ශේෂය අවසන් ගිණුම්වල ගැලපීම් කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | බැංකුවට ලද සෘජු තැන්පතු ගිණුම්ගත නොකිරීමෙන් ප්‍රාග්ධන ආදායම් රු.1,604,941 කින් හා පුනරාවර්තන ආධාර රු.789,671 කින් ද අඩුවෙන් දක්වා තිබුණි. | අවසන් මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.130,621 ක් වූ තැන්පතු සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂය හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | මෙම කාර්යාලයේ 2010 හා ඒ ආසන්න වර්ෂ වල ගිණුම් සකස් කිරීමේ දී මෙසේ තැන්පතු ලෙස රු.130,621 ක මුදලක් සටහන් කරගෙන ගිණුම්ගත කර ඇති අතර ඒ සඳහා කිසිදු උපලේඛනයක් සොයාගත නොහැකි වූ බැවින් තවදුරටත් එම ශේෂය ඉදිරියට ගෙන ඒමට කටයුතු කරන ලදී. |

## 1.4 අනුකූල නොවීම

---------------------

**නීතී, රීතී, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.216,185 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවට අය විය යුතු සියළුම හිඟ ආදායම් එකතු කර ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 217 වැනි රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති මාලාව අනුව කටයුතු කළ යුතුවේ. | වැඩ බැලීම සඳහා අනුයුක්ත කර ඇති ආදායම් පරීක්ෂකවරයාගේ ද සහයෝගය ලබාගෙන ප්‍රකාශිත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | (ii) 218 වැනි රීතිය | සියළුම ඉඩම් හා ගොඩනැගිළි සෑම වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති මාලාව අනුව කටයුතු කළ යුතුවේ. | වැඩ බැලීම සඳහා අනුයුක්ත කර ඇති ආදායම් පරීක්ෂකවරයාගේ ද සහයෝගය ලබාගෙන ප්‍රකාශිත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මු.රෙ. 110 | අවස්ථා 02 කදී සිදු වූ රු.1,100,773 ක රථවාහන හානි සම්බන්ධයෙන් හානි ලේඛනයේ සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවස්ථා දෙකෙහිදීම වාහනය සඳහා පූර්ණ රක්ෂණ වන්දිය ලැබුණු අතර හානි ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළ නිලධාරින්ට උපදෙස් දෙන ලදී. |
| | (ii) මු.රෙ. 396 (ඇ) | මාස 6 ක් ඉක්මවූ රු.45,447 ක් වූ චෙක්පත් 11ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල චෙක්පත් සම්බන්ධයෙන් මෙම වසරේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| | (iii) මු.රෙ. 571 | වසර 02 ඉක්මවූ රු.839,920 ක් වූ තැන්පතු | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | මෙම වසරේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | | 28ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කළ යුතුවේ. | පියවර ගනු ලැබේ. |
| (iv) | මු.රෙ. 880 | ඇප තැබිය යුතු නිලධාරීන් සඳහා ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප මුදල් තැන්පත් කිරීමට මෙම වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. |
| (v) | මු.රෙ. 1645 (ආ) සහ 1646 | වාහන 07 ක ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම වසරේ සිට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස වාහන විෂයය භාර නිලධාරියාට උපදෙස් දෙනු ලැබ ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු .450,562 ක් වූ අතර ඊට ,අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු .3,217,338 ක් විය .

### 2.2 ආදායම්පරිපාලනය

-------------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම්හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 50 | 124 | 124 | - | 50 | 31 | 31 | - |
| කුලී | 3,386 | 3,639 | 3,180 | 459 | 2,165 | 3,336 | 3,647 | 188 |
| බලපත්‍ර ගාස්තු | 125 | 23 | 23 | - | 126 | 124 | 124 | - |
| වෙනත් ආදායම් | 3,358 | 3,887 | 3,226 | 660 | 1,404 | 2,259 | 2,259 | 5453 |
| | 6919 | 7673 | 6553 | 1119 | 3745 | 5750 | 6061 | 5641 |

**2.2.2 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩකාමර හා නිවාස බදු දීමේදී පුද්ගලයන් 04දෙනෙකුට අදාළව 2012 සිට පැවත එන රු.48,350 ක හිඟ මුදලක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සියළු හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට ආදායම් පරිපාලනට උපදෙස් දී ඇත. |
| (ආ) | පවත්නා කඩකාමරවලින් 10 ක් 1990 සිට 2006 අතර කාලසීමාව තුළ ටෙන්ඩර් නොකැඳවා බදුදී තිබූ අතර කඩකාමර 04 ක් සඳහා 2019 වර්ෂය වෙනුවෙන් ගිවිසුම්ගතව නොතිබුණි. එම ගිවිසුම්ගත නොවූ කඩකාමර 04 ට අදාළව 2019 වර්ෂයට අයකරගත යුතු හිඟ හා දඩමුදල් රු.65,736 ක් විය. | බදු දුන් දේපළ සඳහා ගිවිසුම්ගතව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම කඩ කාමර ටෙන්ඩර් පටිපාටිය තුළින් ගැණුම්කරුවන් වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ. තවද සියළු හිඟ මුදල් හා දඩ මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙසට වැඩ බලන ආදායම් පරීක්ෂකවරයා වෙත උපදෙස් දී ඇත. |

**2.2.3 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් වාර්ෂිකව සිදු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂකවරයා ක්ෂේත්‍රයේ යොදවමින් සහා බලප්‍රදේශය තුළ පවත්නා වෙළඳාම් හා ව්‍යාපාර කර්මාන්ත හඳුනාගෙන ඔවුන්ගෙන් නියමිත ගාස්තු අයකර ගැනීම සිදුකරමින් පවතී. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා හඳුනාගෙන සකස් කිරීමට මෙන්ම ඒවා බලාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එසේම නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථා පහක් සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සම්මත කර එම තීරණය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත දැනුම්දෙනු ලැබ තිබේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සැකසිය යුතුවේ. | ඉදිරියේ දී ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) පරිසර බලපත්‍ර නිකුත් කිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායන් 09 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්ත පවත්වා ගෙන යමින් තිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යවසායන් හඳුනාගෙන බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුවේ. | පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත හඳුනාගෙන ඒවාට පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර ඒ පිළිබඳ දැනුවත්භාවයක් ලබා ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන එම ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කිවිල කඩවල කඩකාමර සම්බන්ධව කඩකාමර කුලී ලේඛනයේ සඳහන්ව ඇති නමුත් අයිතිය තහවුරු කෙරෙන වෙනත් ලේඛනයන් සභාව සතුව නොමැති අතර කුලි අයවීමක්ද සිදුව නොතිබුණි. | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයන් ගෙන ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර කටයුතු සොයා බලා අයිතිය තහවුරු කර ගෙන සභාවට ආදායමක් ලබා ගැනිමට හැකි වන ලෙසට මෙම කඩ කාමරය කුලී පදනමට ලබා දිමට කටයුතු කරන ලෙසට ආදායම් පරීක්ෂකවරයාට උපදෙස් දෙන ලදී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරු 06 කට අදාළ පුරප්පාඩු 11 ක් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වසර තුනකට අධික කාලයක සිට අප සභාවේ පවතින උග්‍ර සේවක හිඟය පිළිබඳව අදාළ බලධාරින් වෙත ඉල්ලීම් සිදුකර කල ද මේ වනතෙක් ඊට විසඳුමක් ලැබී නොමැත. |
| (ආ) | විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ට අදාළ රු.228,800 ක ආපදා ණය මුදල් අයකර ගැනීමකින් තොරව පැවතුණි. | සුදුසු ක්‍රියාමාර්ගයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. | ප්‍රාදේශීය සභාවේ හිටපු ලේකම්වරයකු වූ පී.බී.විමලසිරි මහතාගේ පෞද්ගලික ලිපි ගොනුව භාර නොදී ඔහු භාරයේ පවතින බව අනාවරණය වේ. නිලධාරියා විශ්‍රාම වැටුප ලබා ගන්නා තෙක් දැනට හිඟව පවතින මුදල අයකර ගැනීමට නොහැකිව පවතින අතර, මිය ගිය එච්.ඒ.පී.රංජන මහතාගේ ආපදා ණය හිඟ ශේෂය රු.147,600.00 වන අතර, ඔහුගේ මරණය සම්බන්ධයෙන් තවමත් අධිකරණයේ නඩුවක් පවතින අතර අවසාන තීන්දුවක් ලබා දී නොමැති බැවින් මරණ සහතිකය ලබා ගැනීමට නොහැකි වී ඇත. පාරිතෝෂිත මුදලින් මෙකී හිඟ ණය ශේෂය අඩු කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කරුවල වත්ත කඩකාමරයේ කුලී ගැනුම්කරු විසින් එම කඩකාමරය | අනවසර ඉදිකිරීම් සඳහා කඩිනමින් සුදුසු | කරුවල ගහ වත්ත කඩ කාමරයේ කුලී ගැනුම්කරු |

| | | |
|---|---|---|
| පිහිටි ප්‍රාදේශීය සභාවේ ඉඩමෙන් කොටසක් ද ප්‍රයෝජනයට ගෙන ඉදිකිරීමක් කර තිබුණි. | ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | විසින් සභා ඉඩමෙන් කොටසක් ප්‍රයෝජනයට ගෙන ඉදිකිරීමක් කර ඇති බවට ප්‍රමාද වී අණාවරණය වූ අතර අවශ්‍ය නීතිමය කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව පරිහරණය කරන වාහන 05 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබීම නිසා එහි ලියාපදිංචි අයිතිය අමාත්‍යාංශ ලේකම් නමට පවතී. 49-0303, 46-4196 හා WP 8815 දරණ බිම් වාහනවල ලියාපදිංචි අයිතිය වෙනස් කර ගැනීම සඳහා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

### 3.4.3 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු කැබ් රථයක් 2004 වර්ෂයේ සිට ද, ට්‍රැක්ටරයක් 2008 වර්ෂයේ සිටද, නිෂ්ක්‍රීයව පැවතුණි. | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | ධාවන තත්ත්වයේ නොපවතින වාහන අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. |
| (ආ) | ට්‍රැක්ටරයක්, කැබ්රථයක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් 2019 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා 2020 අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ගනු ලැබූව ද එකී ප්‍රතිපාදන මුදල්වලින් යම් කොටසක් කොරෝනා වසංගතය මර්දන ක්‍රියාකාරකම්වලට යෙදවීමට සිදු විය. කෙසේ නමුත් ඉතිරි ප්‍රතිපාදන මුදල මෙම රථය අළුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් වේ නම් මෙම වසරේදීම අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නියමිතය. අනෙකුත් ට්‍රැක්ටර් රථය හා ට්‍රේලරය ඉදිරියේදී අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට අපේක්ෂා කෙරේ. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සැකසිය යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමටත් ඒ අනුව කටයුතු කිරීමටත් අවශ්‍ය පිවයර ගනු ලැබේ. |

**3.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය තුළ මන්ත්‍රී ප්‍රතිපාදන රු.301,340 ක් වැය කර ප්‍රජා මණ්ඩල හා අවමංගල්‍යාධාර සමිති වෙත පුටු හා අනෙකුත් භාණ්ඩ බෙදා දී තිබුණි. බෙදා තිබූ භාණ්ඩ අතුරින් රු.159,300 ක් වටිනා උපකරණ හා පුටු අදාළ මන්ත්‍රීවරයාගේ නිවසේ රඳවා ගෙන තිබුණි. තවද රු.122,880ක උපකරණ ලබාදී වසරක් ගත වී තිබුණද භාවිතයට ගෙන නොතිබුණි. රු.21,420 ක් වටිනා පුටු 18 ක් අස්ථාන ගත වී තිබුණි. | සියළු පාර්ශවයන් විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු අතර ඒ සඳහා විධිමත් ලේඛන පවත්වා ගත යුතුවේ. | මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මිලට ගනු ලැබූ භාණ්ඩ එක් එක් වසමේ මන්ත්‍රීවරයා මගින් අදාළ ප්‍රජා මණ්ඩල හා මරණාධාර සමිති වෙත නිකුත් කරන ලෙසට ගරු සභාවේදී සාකච්ඡා කොට ඇති බැවින් ද, ඇතැම් මන්ත්‍රීවරුන් ප්‍රජා මණ්ඩල හා මරණාධාර සමිතිවල යම් යම් තනතුරු හෙබවීම හේතුවෙන් ද මෙම තත්ත්වය උද්ගත වී ඇත. කෙසේ නමුත්, විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සියළුම මන්ත්‍රීවරුන් දැනුම්වත් කොට, බෙදා දී ඇති එම භාණ්ඩ නොඅඩුව නියමිත ප්‍රජා මණ්ඩල හා මරණාධාර සමිති වෙත වහාම විධිමත් ආකාරයෙන් ලබා දීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ආ) | ආදායම් ලැබීම් සටහන් කිරීම සඳහා ආදායම් ලේඛන වෙන වෙනම නඩත්තු කළ යුතු වුවද වාහන ආදායම්, සතිපොළ ආදායම් හා රැස්වීම් ශාලා ආදායම් සඳහා ආදායම් ලේඛනය නඩත්තු කර නොතිබුණි. | ආදායම් සඳහා නිවැරදිව ලේඛන නඩත්තු කළ යුතුවේ. | ආදායම් ලේඛන වෙන වෙනම නඩත්තු කිරීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙනු ලැබේ. |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මාර්ග සංවර්ධන ව්‍යාපෘති 05 ක් සඳහා ගිවිසුම්වලට එළැඹීමකින් තොරව සංවර්ධන කටයුතු සිදුකර තාක්ෂණ නිලධාරියෙකුගේ වැඩ අවසන් වාර්තාවක් නොමැතිව රු.301,235 ක් ගෙවා තිබුණි. | සංවර්ධන කටයුතු සිදු කිරීමේදී නිසිපරිදි ගිවිසුම්ගත විය යුතුය. | ගිවිසුම්ගතව ඇතත් ඒවා නිසි පරිදි සම්පූර්ණ කර නොමැත. විෂය භාරව කටයුතු කිරීමට නිලධාරියකු නොමැති කමින් මෙම අඩුපාඩු සිදු වී ඇති බව පිළිගන්නා අතර එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් පාලන ආයතනවල පෙරටු කාර්යාල ස්ථාපනය කිරීමේ වැඩසටහන 2017 අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.283,998 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේ දී පරිගණක හා උපාංග කට්ටල 03 ක් හා මුද්‍රණ යන්ත්‍රයක්ද එම අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ නමුත් 2020 ජූලි 03 දින වන විටද පෙරටු කාර්යාලයක් ස්ථාපනය කර නොතිබුණි. තවද එම උපකරණ මේ වන විට විනාශ වෙමින් පැවතුණි. | පෙරටු කාර්යාල ස්ථාපනය කිරීම හා වත්කම්වල කල්පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කළ යුතු වේ. | දැඩි කාර්යය මණ්ඩල හිඟය නිසා පෙරටු කාර්යාල වැඩසටහන කිසිසේත් ක්‍රියාත්මක කල නොහැකිව ඇණහිට ඇත. පෙරටු කාර්යාල ක්‍රමය සඳහා ලබා දුන් පරිගණක උපාංගවලින් UPS හා එක් මොනීටරයක් පමණක් අකර්මණ්‍යව පවතින අතර, ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ලබාදුන් පසු පෙරටු කාර්යාලය ස්ථාපිත කිරීමට කටයුතු කළ හැකි වේ. |
| (ආ) | 2014 අයවැය යෝජනා අනුව සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පළාත් පාලන මහජන නියෝජිතයින් සඳහා සහනදායී පදනමට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන යටතේ සභිකයන් 08 දෙනෙකුගෙන් අයකරගත් රු.317,870ක මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීමට 2020 ජූලි 03 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අප්‍රමාදව අදාළ මුදල අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන මහජන නියෝජිතයින් 07 දෙනෙකු සඳහා යතුරුපැදි ලබාදීමට අයකරගත් රු.317,870 ක් පොදු තැම්පත් ගිණුමේ රදවාගෙන ඇති අතර, ඒ පිළිබඳව සොයා බලා එම මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙත යැවීමට මෙම වර්ෂයේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |